# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளீர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: .....
දිනය / திகதி / Date: 2023.04.11

සමෘද්ධි ප්‍රජා මූල බැංකු චක්‍රලේඛ අංක :- 2023/04 ට පළමු එකතුව
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන් සහ
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/ බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**"අපේකම රැකගනිමු - ඉතුරුමට මග කියමු"**
**සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා**
**අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2023**

සිංහල හා හින්දු අළුත් අවුරුද්ද නිමිත්තෙන් මෙවරත් ගණුදෙනු කිරිම හා අළුත් අවුරුදු උත්සවය සංවිධානාත්මකව වසර තුනකට පසු පැවැත්විමට අදාලව අංක 2023/04 දරණ හා 2023.04.04 දිනැති චක්‍රලේඛය මගින් දැනටමත් උපදෙස් ලබා දි ඇත.

02.එම චක්‍රලේඛයෙහි අංක 3.1 පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි. ඒ අනුව 2023.04.15 දින රජයේ බැංකු ගණුදෙනු කටයුතු නොකරන බැවින් මුදල් ලබා ගැනීමේදි හා අනිකුත් කටයුතු වලදි යම් ගැටළු සහගත තත්වයක් මතුවන බැවින් අළුත් අවුරුදු ගණුදෙනු 2023 අප්‍රේල් 17 දින සිදු කිරිමට කටයුතු කරන ලෙස කාරුණික දන්වමි.

03. අළුත් අවුරුදු ගණුදෙනු හා උත්සව පැවැත්විම පිළිබඳව ඇතැම් නිලධාරින් විසින් යම් මැලිකමක් හා ප්‍රතික්ෂේප කරන තත්ත්වයක් පවතින බැවින් එහි බලතල හා වගකිම් බැංකු සහකාර කලමනාකරුට හා කලාප සහකාර කළමනාකරුට පැවරිම කළ යුතුය. එසේ නොමැති නම් වගකිම් දරණ යම් නිලධාරියෙකුට පැවරිය යුතුය. එමෙන්ම අවුරුදු උත්සවය පැවැත්විමේ කටයුතු අදාළ ප්‍රජාමූල බැංකුව මූලික කරගත් ප්‍රජාමූල සංවිධානයක් මගින් සංවිධානය කරන බැවින් උත්සවය සඳහා අදාල මුදල් ප්‍රජාමූල සංවිධානයට හෝ අදාළ වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියාට ලබා දිමට කටයුතු කළ යුතුය.

04. බැංකු කළමනාකරු රාජකාරියෙන් ඉවත් වි සිටින අවස්ථාවක බැංකු සේප්පුවේ හා කාර්යාලයට අදාල ඉබි යතුරු සහකාර කළමනාකරුට භාර දිමට කටයුතු කළ යුතු අතර සහකාර කළමනාකරු සේවයට වාර්තා නොකරන අවස්ථාවලදි ඒ සඳහා වැඩ බැලිමට පත් කරන ලද නිලධාරියාට ලිඛිතව සේප්පුවේ ඉබි යතුරු හා කාර්යාල ඉබි යතුරු භාර දීමට කටයුතු කළ යුතුය. එමෙන්ම කළමනාකරු නොමැති අවස්ථාවලදි ඊට අදාළ යතුරු නිසි පරිදි බාර දිම ඔහු සතු වගකිමක් වේ.

05. මේ සම්බන්ධ අනිකුත්උපදෙස් නිකුත් කළ ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි තවදුරටත් බලපැවැත්වේ.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ බල ගැන්විම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel- 011-2872202
Fax - 011-2889002
E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)
மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)
Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
**Hot Line :0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி )
Director ( Micro Finance)
011-2889003
011-2887469
**Hot Line:0112-885582**

කාර්යාලය
அலுவலகம்
Office
0112872202
**Hot Line: 011- 2887722**